ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි සිව්වන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය –2017 ජූලි/අගෝස්තු

ආර්ථික විද්‍යාව

**ECON 4130.03 – අන්තර් ජාතික ආර්ථික ප්‍රතිපත්ති**

කාලය : පැය තුනයි (03)

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

---

1. "නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය (Free Trade Policy) සැමවිටම හොඳම වෙළෙඳ ප්‍රතිපත්තිය නොවිය හැකිය". විමසන්න.

2. i. වාණිජවාදීන්ගේ මූලික අදහස් කෙටියෙන් දක්වන්න.

   ii. වාණිජවාදීන්ගේ අදහස් පිළිබඳව විවිධ පාර්ශවයන් විසින් පසුකාලීනව (වාණිජවාදයෙන් පසු) දැඩි ලෙස විවේචනයට ලක් කරණු ලැබිණ. එසේ ඉදිරිපත් කරන ලද විවේචන පැහැදිලි කරන්න.

3. 1879 සිට පළමු ලෝක යුද්ධය දක්වා කාලය තුල බ්‍රිතාන්‍යය ද ඇතුළු යුරෝපයේ ජාත්‍යන්තර වෙළඳාම පරිහානියට පත් වීමට බලපෑ සාධක විස්තර කරන්න.

4. ලෝක යුද්ධ දෙක අතර කාලය තුල ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රතිපත්ති ආරක්ෂණවාදයට නැඹුරුවීමට බලපෑ හේතු පැහැදිලි කරන්න.

5. වෙළෙඳාම හා තීරුබදු පිළිබඳ පොදු ගිවිසුම (GATT) මගින් අත්කර ගත් ජයග්‍රහනයන් (වාසි) සහ එම ගිවිසුමේ පැවති දුර්වලතා කවරේද යන්න පැහැදිලි කරන්න.

6. i. රටවල් අතර සිදුවිය හැකි ආර්ථික ඒකාබද්ධතාවන්ගේ විවිධ අදියරයන් කෙටියෙන් පැහැදිලි කරන්න .

   ii. කලාපීය ආර්ථික ඒකාබද්ධතාවන් මගින් ආර්ථික සුභසාධනයක් සිදුවිය හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

7. පහත දැක්වෙන මාතෘකා අතුරින් **හතරක් (4)** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

   i. යුරෝපා හවුල (EU)

   ii. අග්නිදිග ආසියාතික ජාතීන්ගේ සංගමය (ASEAN)

   iii. ලෝක වෙළඳ සංවිධානයේ රෙදිපිලි හා ඇඟළුම් ගිවිසුම (ATC)

   iv. පශ්චාත් යුද්ධකාලීන ජාත්‍යන්තර ආර්ථික ක්‍රමය තුල පිහිටවූ ප්‍රධාන ආයතන ත්‍රිත්වයේ අරමුණු හා කාර්යයන්

   v. තීරුබදු පැනවීම මගින් ජාතික සුභසාධනය ඉහළ නැංවිය හැකිය යන තර්කය **(ප්‍රශස්ත තීරුබදු මට්ටම)**

************